ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

****

**පුවත්පත් නිවේදනය**

**අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා ශ්‍රී ලංකාවේ 73 වන නිදහස් දින සංවත්සරය වෙනුවෙන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාට සුබ පැතුම පිරිනමයි**

අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා ශ්‍රී ලංකාවේ 73 වන නිදහස් දින සංවත්සරය වෙනුවෙන් අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාට සිය සුබ පැතුම් පිරිනැමුවේය.

දෙරටට පොදු භාෂාමය, ආගමික සහ සංස්කෘතික සම්ප්‍රදායන් මත පදනම් වූ සියවස් ගණනක් පැරණි ගැඹුරින් මුල් බැසගත් සබඳතා අග්‍රමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා මෙහිදී අවධාරණය කළේය. පසුගිය වසර තුළ කොවිඩ්-19 වසංගතයට එරෙහිව එක්ව සටන් කිරීම ඇතුළු අනෙකුත් අංශයන් තුළ දෙරට අතර පැවති සහයෝගීතාවය ද එතුමා මෙහිදී සඳහන් කළේය. දෙරට අතර පවතින ශක්තිමත් සබඳතා ඉදිරි වසර වලදී වඩාත් ශක්තිමත් වේවා යි සහ එම සබඳතා දෙරට ජනතාවගේ ප්‍රගතිය සහ පොදු සෞභාග්‍යය උදෙසා ඉවහල් වේවා යි එතුමා ප්‍රාර්ථනා කළේය.

අග්‍රාමාත්‍යතුමාගේ සුබ පැතුම් පණිවුඩය ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර නායකත්ව මට්ටමෙන් සිදුවන නිරන්තර අන්තර්ක්‍රියාවන් ඉදිරියට ගෙනයාමක් වන අතර එවන් අන්තර්ක්‍රියා කොවිඩ්-19 වසංගතය විසින් මතු කර ඇති අභියෝගයන් හමුවේ වුව ද සංවර්ධන සහයෝගීතාවය, වෙළඳ සහ ආර්ථික

සබඳතා සහ ජනතාව අතර සබඳතා සැලකිය යුතු ලෙස වර්ධනය කිරීමට උපකාරී වී ඇත.

*****

**කොළඹ**

**2021 පෙබරවාරි 02**